# බණ්ඩාරනායක මැතිනිය - පාර්ලිමේන්තුවේදී

සැම් විජේසිංහ

බොහෝ දෙනෙකු අතර පවතින අදහස නම්, තම ස්වාමි පුරුෂයාගේ මරණයත් සමග බණ්ඩාරනායක මැතිනිය ඔහු ඉසිලූ අගමැති පදවියට පත් වී දේශපාලනයට පිවිසි බවයි. නමුත් නියම සිදුවීම එය නොවේ. 1959 සැප්තැම්බර් මස සිදු වූ බණ්ඩාරනායක මහතාගේ හදිසි මරණයත් සමග ඩබ්ලිව්. දහනායක මහතා අගමැති තනතුරට පත්විය. එසේ වුව ද, ඔහුගේ සේවා කාලය ඉතා කෙටි විය. එනම් 1959 දෙසැම්බර් 3 වනදා දක්වා පමණි. ඔහුට තම කැබිනට් සගයින් සමග ක්‍රියා කිරීමට නොහැකි වූ හෙයින් ආණ්ඩුව බිඳ වැටුණි.

ඉන් පසු එළඹුණු මහා මැතිවරණය, පළමු වරට, එක් දිනයක් තුළ පවත්වන්නට යෙදිනි. ගුවන් විදුලිය ඔස්සේ මැතිවරණ කථා පැවැත්වීමට අවස්ථාවක් සැලසුණු අතර, තැපැල් ඡන්ද ක්‍රමය ද හඳුන්වා දෙන ලදී. කොඩි, බැනර් සහ වෙනත් ප්‍රචාරක ද්‍රව්‍ය පොදු ස්ථානයන්හී ප්‍රදර්ශනය කිරීම තහනම් කෙරුණි. ඡන්ද දායකයිනට ඡන්දය දීම සඳහා පෞද්ගලික ප්‍රවාහන පහසුකම් සැලසීම ද, තහනමකට යටත් වුණි. අද ඡන්දය ආශ්‍රිතව කෙරෙන අති විශාල වියදම් ගැන මෙනෙහි කරන විට මෙවැනි සීමාවන් යළි පැනවීම කෙතරම් අවශ්‍ය ද යන්න අපට කල්පනා වේ.

1959 පෙබරවාරි මාසයේ පත් කරන ලද මැතිවරණ කොට්ඨාස බෙදා වෙන්කිරීමේ කොමිසම මගින් මන්ත්‍රීවරු 151කින් සමන්විත පාර්ලිමේන්තුවක් නිර්දේශ කෙරිණි. මෙය එතෙක් සිටි මන්ත්‍රීන් සංඛ්‍යාව වූ 101 සමග බලන විට සැලකිය යුතු වැඩි වීමකි. පාර්ලිමේන්තුව 1959 දී විසුරුවන විට 1956 පිහිටුවන ලද රජයේ මන්ත්‍රීවරු 25ක් පමණ පාර්ලිමේන්තුවේ සිටියේ නැත. 1956 රජයේ ප්‍රධාන හවුල්කාර කොටස වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමග අගමැති

දහනායක අමනාප විය. ඇත්ත වශයෙන්ම බණ්ඩාරනායක මහතා ළඟට ජ්‍යෙෂ්ඨත්වය දැරුවේ සී.පී. ද සිල්වා මහතාය. නමුත් තම නායකයාගේ ඝාතනය සිදුවන විට ඔහු විදේශගතව සිටි හෙයින් අනුප්‍රාප්තිකයා ලෙස ඔහු සලකනු ලැබුවේ නැත.

පසුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නව සභාපති ලෙස 1960 මහ මැතිවරණයේ දී ඔහු එම පක්ෂයට නායකත්වය දුණි. මෙම මැතිවරණ සටනට විවිධ පක්ෂ 22ක් ඉදිරිපත් විය. මැතිවරණ සටන උග්‍ර තත්ත්වයකට පත් වූ විට එයට සහභාගී වන ලෙස බණ්ඩාරනායක මැතිනිය පොළඹවා ගනු ලැබීය. සටනට එක් වූ එතුමිය තම සැමියාගේ ප්‍රතිපත්ති ඉදිරියට ගෙන යෑම සඳහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ඡන්දය දෙන ලෙස කියා සිටියාය.

මන්ත්‍රීවරු 151කින් සමන්විත වූ නව පාර්ලිමේන්තුවේ වැඩි ආසන ගණනක් එනම්, ආසන 50ක් ජයගැනීමට එක්සත් ජාතික පක්ෂය සමත් වුව ද, එය ස්ථාවර ආණ්ඩුවකට ප්‍රමාණත් නොවීය. සී.පී. ද සිල්වාගේ නායකත්වය යටතේ වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ආසන 46ක් ලැබුණි.

එක්සත් ජාතික පක්ෂයේ නායක ඩඩ්ලි සේනානායක මහතාට රජයක් පිහිටුවන සේ අග්‍රාණ්ඩුකාර ශ්‍රීමත් ඔලිවර් ගුණතිලක මහතා විසින් ආරාධනා කරන ලදී. ඒ අනුව පළමුවන පාර්ලිමේන්තු සැසිවාරයේ දී කථා නායකවරයෙකු පත් කිරීමට අවශ්‍ය විය. කථානායක තනතුරට රජය නම් කළ තැනැත්තා වැඩි ඡන්ද 33කින් පරාජය විය.

රාජාසන කථාව පැවැත් වූ අවස්ථාවේ දී මුලසුන හෙබවූයේ ජයග්‍රාහී විරුද්ධ පක්ෂ අපේක්ෂකයා වූ ටී.බී. සුබසිංහ මහතාය. රාජාසන කථාවට සම්බන්ධ ප්‍රධාන යෝජනාවට විරුද්ධ පක්ෂය ඉදිරිපත් කළ සංශෝධනයක් සඳහා 86ක් පක්ෂව සහ 61ක් විපක්ෂව ඡන්ද ලැබී සම්මත වූයෙන් ප්‍රධාන යෝජනාව පරාජය විය. මෙම පරාජය හේතුවෙන් ඩඩ්ලි සේනානායක රජය ඉල්ලා අස්වූ අතර, නව මහා මැතිවරණයක් 1960 ජුලි 20 වැනි දින පැවැත්වීමට නියම විය.

මේ අතර බණ්ඩාරනායක මැතිනිය වෙත ගලා ආ අති විශාල මහජන ප්‍රසාදය සැලකිල්ලට ගෙන සී.පී. ද සිල්වා මහතා ශ්‍රී ලංකා නිදහස් පක්ෂ නායකත්වයෙන් ඉල්ලා අස් විය. එම තනතුරට මැතිනිය ඒකච්ඡන්දයෙන් පත්වූවාය.

1961 පවත්වන ලද දෙවැනි මහා මැතිවරණයේ ජය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ලැබුණි. බණ්ඩාරනායක මැතිනිය ඡන්දයට ඉදිරිපත් නොවූවත්, අගමැතිනිය ලෙස දිවුරුම් දෙන ලෙස අග්‍රාණ්ඩුකාර ශ්‍රීමත් ඔලිවර් ගුණතිලක මහතා එතුමියට ආරාධනා කරනු ලදුව, 1960 ජුලි 21 වැනි දින දිවුරුම් දීම සිදුවිය. ඒ අනුව එතුමිය එවැනි තනතුරකට පත් වූ ලොව ප්‍රථම කාන්තාව වූවාය. නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ පාර්ලිමේන්තු අසුනක් සඳහා තරඟ නොකළ හෙයින් එතුමිය සෙනෙට් සභාවේ මන්ත්‍රී කෙනෙකු ලෙස නම් කෙරිණ. ඒ අනුව එතුමිය මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකත්වය නොමැතිව ශ්‍රී ලංකාවේ අගමැතිකම ඉසිලූ එකම පුද්ගලයා ලෙස හැඳින්විය හැකිය. උසස් අධ්‍යාපනික මට්ටමක් නොතිබුණ ද, එතුමිය ප්‍රායෝගික දැනුමෙන් පොහොසත් වූ අතර, අවංකත්වයෙන් අනූන වූවාය. මෙම චරිත ලක්ෂණ ඇයව පත්කරනු ලැබූ උසස් තානාත්තරයේ කටයුතු කරගෙන යෑමේ දී මහෝපකාරී විය. මීට අමතරව එතුමිය අභියෝගයක් ලෙහෙසියෙන් අත් නොහරින, අරමුණු සමග තදින් බැඳී සිටින, ධෛර්ය සම්පන්න, අතිශයින් අධිෂ්ඨානවත්, අත්‍යවශ්‍ය දේ තෝරා බේරා ගැනීමේ කුසලතාවයක් ඇති කෙනෙකු ලෙස කැපී පෙනුණි. මෙම වැදගත් චරිත ලක්ෂණ මීළඟ දශක හතරක කාලය තුළ අභියෝගයන්ට සාර්ථකව මුහුණ දීමට ශක්තියක් වීම එතුමියට මෙන්ම රටට ද පිහිටක් විය. විශේෂයෙන්ම 1977න් පසු එතුමිය මුහුණදුන් දුෂ්කර කාල පරිච්ඡේදයන් හී දී මෙවන් ගුණාංග නොතිබෙන්නට එතුමියට හිස ඔසවන්නට නොහැකි වනු නියතය.

දේශපාලඥයින් අතර විරල ගුණාංගයක් වන අවංකභාවය බණ්ඩාරනායක මැතිනියට නොඅඩුව තිබුණි. මෙය එතුමිය මුණ ගැසුන නායකයින්ගෙන් නිතැතින්ම උණුසුම් ප්‍රතිචාර ලැබීමට හේතු විය. අගමැති ලෙස එතුමියගේ පළමුවන කථාව පැවැත්වූයේ 1961 සැප්තැම්බර් 01 වැනි දාය. රාජාසන කථාව සෙනෙට් සභාවේ සාකච්ඡාවට භාජනය වූ අවස්ථාවේ ඇය කළ කථාවෙන් තම දේශපාලන ගමන වමට හෝ දකුණට බර නොවූ මැද මාවත බව අවධාරණය කළාය. තම කථාවේ දී ජනසතු කිරීම, අධ්‍යාපනය සහ මාධ්‍යය ගැන මෙන්ම ජාතික සේවය පිළිබඳ සංකල්පය ගැන ද කරුණු ඉදිරිපත් කෙරුණි. තම රජය තම නැසීගිය ස්වාමි පුරුෂයා වූ, දිවංගත අගමැතිතුමාගේ ප්‍රතිපත්ති ඉදිරියට ගෙන යෑමට මුළුමනින්ම කැපවී සිටින බව ඇය අවධාරණය කළාය. පාර්ලිමේන්තු විවාදයක් තුළ එතුමියගේ සුවිශේෂී දායකත්වයක් ලෙස සැලකෙන්නේ 1961 නොවැම්බර් මස ජාතික අධ්‍යාපන ක්‍රමයක් ඉදිරිපත් කිරීම අළලා කළ කථාවයි. සමාජයේ බෙදීම් තීව්‍ර නොකොට හැකි තරම් අවම කරමින් සාමානත්වයක් ඇති කිරීම එම ප්‍රතිපත්තිය පිටුපසින් ඇති දර්ශනය බව ඇය පැහැදිලි කළාය.

ගැඹුරු දේශපාලන ප්‍රශ්නවලට ආගන්තුක වුව ද, 1961 පැන නැගුණ චීන - ඉන්දියා දේශසීමා මතභේදයේ බැරෑරුම් කම ද, ශ්‍රී ලංකාව කෙරෙහි එහි බලපෑම ද, එතුමිය මනාව වටහා ගත්තාය. එවකට අපගේ සම්භාව්‍ය පැරණි මිතුරන් දෙදෙනෙක් විනාශකාරී යුද්ධයකට අර අදිමින් සිටියහ. යම් ප්‍රශ්නයක හරය වෙත සෘජුවම පිවිසීමට සහ ඒ පිළිබඳව ක්ෂණයකින් ක්‍රියාත්මක වීමට තමන් සතු දක්ෂතාවය මොනවට පෙන්වමින්, තවමත් ළදරු අවස්ථාවෙහි වූ නොබැඳි ව්‍යාපාරයේ ප්‍රධාන රටවල රැස්වීමක් එතුමිය කැඳවීය. බුරුමය, කාම්බෝජය, ඊජිප්තුව, ඝානාව සහ ඉන්දුනීසියාව යන රටවල් පහක් එතුමියගේ නායකත්වය යටතේ කොළඹ දී රැස්විය. ප්‍රශ්නය දිග්ගැස්සෙන යුද්ධයකට

පරිවර්තනය වනු වැළැක්වීම සඳහා ඉන්දියාවට සහ චීනයට ගොස් සාකච්ඡා කිරීමට තම නියෝජිතයා ලෙස බණ්ඩාරනායක මැතිනිය මෙහිදී පත් කරනු ලැබීය. එතුමියගේ දූරදර්ශී ක්‍රියාමාර්ගය හේතුවෙන් ප්‍රශ්නය තරමක් දුරට යටගැසී ආසියාවේ නායකයින් වූ මෙම රටවල් දෙක අතර සම්බන්ධතාවය යහපත් නැඹුරුවක් ගත් බව පිළිගත යුතුය. දැනට පවතින තත්ත්වය ගැන මෙනෙහි කරන විට ඒ අවස්ථාවේ දී බණ්ඩාරනායක මැතිනියගේ මූලාරම්භනය ගැන අපට ආඩම්බර විය හැක, මන්ද දිගින් දිගට යන විරුද්ධවාදීකම් මග හැරවීමට සාකච්ඡා මාර්ගයේ වැදගත් කම පසු කාලීනව සිද්ධාන්තයක් බවට පත් වීමයි.

සීතල යුද්ධයේ උග්‍රම අවස්ථාවේ දී අප අවට රටවල්, ලෝක බලවතුන් වන එක්සත් ජනපදය ත්, රුසියාව ත් අතර ගැටීමක් ඇති වුවහොත් එයට පැටලීමේ අවදානම ගැන බියෙන් පසු වූ පසුබිමක ඉන්දියානු සාගරය සාම කලාපයක් බවට පත් කළ යුතු යැයි යෝජනා කළේ බණ්ඩාරනායක මැතිනියයි.

බණ්ඩාරනායක මැතිනියට නොබැඳී සංකල්පය, සැබෑ ලොවින් ගැලවීමේ මාවතක් නොවීය. එය සැබෑ ක්‍රියාශීලී ප්‍රතිපත්තියක් විය. නොබැඳි තත්ත්වයේ පසුවන විට මුහුණ පෑමට සිදුවන සෑම ප්‍රශ්නයක දීම තම ස්ථාවරයේ පිහිටා ක්‍රියා කළ යුතුය. නොබැඳි පිළිවෙත අනුගමනය කිරීමේ වගකීම ගැන සැලකිලිමත්ව එතුමිය විසින් අර්ථවත්, ප්‍රායෝගික, බුද්ධිමත් තීරණ ගනු ලැබීය. යුක්තියට සහ සාධරණත්වයට කැප වී සිටි එතුමිය ප්‍රශ්නයකට ප්‍රායෝගික විසඳුමක් ලබාදීමේ අවශ්‍යතාවය ගැන අවබෝධයකින් ක්‍රියා කළාය.

බණ්ඩාරනායක මැතිනියගේ ජයග්‍රහනයන්ගේ මුදුන් මල්කඩ ලෙස සැලකෙන්නේ 1976 පැවැත්වුණ නොබැඳි සමුළුවයි. ලෝක දේශපාලන සිතියමට රාජ්‍යතාන්ත්‍රික වශයෙන් ශ්‍රී ලංකාව පිවිසුන ප්‍රථම අවස්ථා මෙයයි. නොබැඳි ලෝකයේ නායකයින් සියලුම දෙනා වාගේ ශ්‍රී ලංකාවට පැමිණි අතර, බණ්ඩාරනායක මැතිනිය සමුළුවේ සභාපතිත්වය ඉතාම විශිෂ්ඨ ලෙස දැරුවාය. ඉන්පසුව ලෝකයේ ජාතීන් අතර ශ්‍රී ලංකාවට වැදගත් තැනක් හිමිවිය. පසු කාලයක දී දේශපාලන බල අරගල හේතුවෙන් ශ්‍රී ලංකාවට යම් අවාසි සහගත වූ දුෂ්කර තාවයනට මුහුණ දීමට සිදු වුව ද, බණ්ඩාරනායක මැතිනිය පිළිබඳව ඉමහත් කෘතඥතාවයෙන් සිහිපත් කරනු ලබන බව පැහැදිලිය.

බණ්ඩාරනායක මැතිනිය රාජ්‍ය නායිකාව ලෙස සේවය කළ කාල පරිච්ඡේද දෙකේ දීම එතුමියට විවිධ අභියෝගවලට මුහුණ දීමට සිදුවිය. මේ අතරින් විශේෂයෙන්ම සඳහන් කළ යුත්තේ 1962 රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයයි. ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරීන් කිහිප දෙනෙක් සහ ආරක්ෂක හමුදාවන්හී වෙනත් නිලධාරීන් කිහිප දෙනෙක් රජය පෙරලීමට ප්‍රයත්නයක් දැරූහ. වාසනාවකට තීරණාත්මක මොහොතට කලින් කුමන්ත්‍රණය ගැන දැන ගැනීමට හැකිවිය. බණ්ඩාරනායක මහතාගේ කිට්ටු ඥාතිවරයෙකු වූ තරුණ ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායකගේ තියුණු ප්‍රශ්න කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් කුමන්ත්‍රණයේ සියලු විස්තර අනාවරණය විය. බණ්ඩාරනායක මැතිනියගේ පළමුවන කැබිනට් මණ්ඩලයේ ඇමතිවරයෙකු වූ ඔහු, 1980 මැද භාගයේ දී අකල් මරණයකට භාජන වනතෙක් එතුමියගේ විශ්වාසය දිනාගත් සහායකයෙකු විය.

කුමන්ත්‍රණය පිළිබඳ කරුණු අන්වේෂණය පිළිගත් වෘත්තීය පටිපාටිවලට අනුකූලව සිදු කෙරුණත් කුමන්ත්‍රණකරුවනට එරෙහිව නඩු පැවරීම නිසි පරිදි සිදු නොවීය. රටේ බලපැවැති සාමාන්‍ය නීතිය අනුව ක්‍රියාකරනු වෙනුවට, එවකට අධිකරණ ඇමති සෑම් පී.සී. ප්‍රනාන්දු මහතා විසින් 1962 අංක 1 දරන ආඥා පනතින් සංශෝධනය කර තුබුණ, අපරාධ නඩු විධි විධාන සංග්‍රහයේ 440 වැනි වගන්තිය යටතේ අග්‍රවිනිශ්චයකාර තුමාට නියෝගයක් නිකුත් කරන ලදී. ඉන් කියා සිටියේ නමින් සඳහන් කළ පුද්ගලයින් 24 දෙනෙකුට එරෙහිව 1962 අංක 1 දරන ආඥා පනතේ 6(2) දරන වගන්තියෙන් සංශෝධන කෙරුණ, දණ්ඩ නීති සංග්‍රහයේ 115 වැනි වගන්තිය යටතේ දඬුවම් පැමිණ විය හැකි වරද සම්බන්ධයෙන්, ජූරි සභාවක් නොමැතිව විනිශ්චයකාරවරු තිදෙනෙක් ඉදිරියේ නඩු පැවරිය යුතු බවයි. අග්‍රවිනිශ්චයකාර තුමාට අධිකරණ ඇමති විසින් නිකුත් කරන ලද දෙවැනි නියෝගයකින් කියා සිටියේ 1962 අංක 1 දරන ආඥා පනතේ නව වැනි වගන්තිය අනුව, ඉහත සඳහන් විනිශ්චය සභාවේ සාමාජිකයන් ලෙස පහත නම් සඳහන් ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන් තමා නම් කරන බවයි.

(1) රාජ නීතිඥ ගරු ටී.එස්. ප්‍රනාන්දු
(2) ගරු එල්.බී. ද සිල්වා
(3) ගරු පී. ස්කන්ධ රාජා

සති කිහිපයක නඩු විභාගයකට පසුව, උසාවියේ තීරණය වූයේ ජූරි සභාවක් නොමැතිව අවුරු සමේශනයක් (ට්‍රයල් - ඇට් - බාර්) ස්ථාපනය කිරීමට අටවැනි වගන්තියෙන් බලය ලබාදුන් 1962 අංක 1 දරණ ආඥා පනත බලයානුකූල බවයි. කෙසේ වුව ද, විනිශ්චයකාරවරු නම් කිරීමට ඇමතිට බලය ලබාදුන් 9 වැනි වගන්තිය රජයේ අධිකරණ බලය පවරා තිබෙන ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරුන්ගේ අධිකරණ බලයට අත ගැසීමක් ලෙස එම තීරණයේ වැඩිදුරට සඳහන් විය. මෙම බලය මීට පෙරාතුව අනිවාර්යයෙන්ම අධිකරණය විසින් මෙහෙයවන ලද බලයකි. මෙම බලය අධිකරණයෙන්

බාහිර කුමන හෝ බලධාරියෙකුට පැවරිය නොහැක්කක් විය. ඒ අනුව 1962 අංක 1 දරන ආඥා පනතේ 9වැනි වගන්තිය බලාතික්‍රමණයක් ලෙස තීරණය කරනු ලැබීය.

විනිශ්චයකාරවරුන් වැඩිදුරටත් ප්‍රකාශ කර සිටියේ අධිකරණ ඇමති ගෙන තිබෙන තීරණය, හොවාඩ් ස්වාමිවරයා නැවත ප්‍රකාශ කර තිබෙන පරිදි අධිකරණ බලය උපයෝගී කර ගැනීමට අදාළ මූලික සිද්ධාන්තයනට පටහැනි බවයි. එනම්, "යුක්තිය ඉටුකළ යුතුවා පමණක් නොව එය ඉටු කෙරෙන බව පැහැදිලිවම, නිසැකවම පෙනෙන්නට තිබිය යුතුය යන්න යම් ප්‍රමාණයක වැදගත්කමක් නොව මූලික වැදගත්කමක් උසුලයි" යන්නයි.

මින් පසුව 1962 නොවැම්බර් 14 වැනි දින පාර්ලිමේන්තුව විසින් 1962 අංක 31 දරන දණ්ඩ නීති ආඥා පනත පනවන ලදී. එහි පරමාර්ථය වූයේ 1962 ඔක්තෝබර් 3 වැනි දින පළමුවන විනිසුරු මඩුල්ල දුන් තීන්දුවෙන් පැනනැගුණ ගැටලුව ඉවත් කිරීමය.

සතියකට පසුව නීතිපති විසින් 1962 අංක 31 දරණ ආඥා පනත යටතේ දෙවැනි නිවේදනයක් නිකුත් කරන ලදුව, අග්‍රවිනිශ්චයකාර එච්.එච්. බස්නායක විසින් පහත සඳහන් නව ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඩුල්ලක් නම් කරන ලදී,

(1) ගරු එච්.එම්.සී. සන්සෝනි (සභාපති)
(2) ගරු ජ්‍යෙෂ්ඨ විනිසුරු එච්.එන්.ජී. ප්‍රනාන්දු
(3) ගරු එල්.බී. ද සිල්වා

නියම නඩු විභාගය ආරම්භ වූයේ 1963 ජුනි 30 වන දිනය. එය නව නීති වාර්තා 67 වැනි වෙළුමේ පිටු අංක 193 සිට 424 දක්වා වාර්තා කර තිබේ. අවසානයේ දී විත්තිකරුවන් 11 දෙනෙකු වරද කරුවන් කරනු ලදුව, නඩු විභාගය පැවැත් වූ විශේෂ "සිද්ධියෙන් පසු" නීතියේ සඳහන් අවම දඬුවම වන 10 වසරක සිරදඬුවමක් ඔවුන්ට නියම කරන ලදී.

නඩුවේ විනිශ්චය කියවීම අවසන් කරමින් විනිසුරු මඩුල්ලේ සභාපති සන්සෝනි විනිසුරුතුමා, 1962 ආඥා පනත මගින් චූදිතයන් කලින් පාත්‍ර වූ දඬුවම මුළුමණින්ම වෙනස් කර ඇති බව අවධානයට යොමු කළේය. විනිශ්චය මණ්ඩලයට අයත්ව තුබුණ අභිමතය ඉවත් කර වසර 10 සිර දඬුවමක් නියම කිරීම අනිවාර්ය කරනු ලැබීය. එසේම දේපළ රාජසන්තක කිරීම අනිවාර්ය කර තුබුණි. "මෙම විචක්ෂණය අපට තේරුම් ගත නොහැක. ඔප්පු කරන ලද කුමන්ත්‍රණය සඳහා දණ්ඩ නීති සංග්‍රහයේ වෙනත් වගන්ති යටතේ දඬුවම් පැමිණ වීමට හැකියාව තුබුණි. සිද්ධියෙන් පසුව ඉදිරිපත් කළ සංශෝධනය මත යැපෙන්නට අපට අවශ්‍යතාවයක් නැත."

වරදකරුවන් වූ විත්තිකරුවන් බ්‍රිතාන්‍යයේ ප්‍රිවි කවුන්සලයට අභියාචනයක් කරනු ලදුව, විනිසුරුවරු පස්දෙනෙක් ඉදිරියේ අභියාචනය විභාගයට ගැනුණි. 1965 දෙසැම්බර් 2 වැනිදා ප්‍රකාශ කළ නඩු තීන්දුවෙන් පියර්ස් සාමිවරයා මෙසේ පැවසීය. "මෙවැනි ආඥා පනත් (1962 අංක 1 දරන ආඥා පනත වැනි) වලංගු වන්නේ නම් අධිකරණ බලය ව්‍යවස්ථාදායකයේ පූර්ණ ග්‍රහනයට පත්වී විනිසුරුවරුන්ගේ අතින් ගිලිහී යනු ඇත. ව්‍යවස්ථාදායකයට එවැනි අදහසක් නොතිබුණ බවට අපට සැකයක් නැත. උග්‍ර අවස්ථාවකට මුහුණ දීමට එයට සිදු වූ විට බරපතල තීරණ ගැනීමට එය පෙළඹුණි. එක් වරක් කළ දේ, එයට ඉඩ හැරියහොත්, එතරම් උග්‍ර නොවන අර්බුද අවස්ථාවන්හී දී ද උපයෝගී කරගනු ඇත. ඒ අනුව අධිකරණ බලය බාදනය වේ. එවන් බාදනයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පැහැදිලි අරමුණට පටහැනිය." විනිසුරු සාමිවරුන්ගේ මතය වූයේ ලංකාවේ නඩු විභාගයට අදාළ ආඥා පනත් බලය ඉක්මවා ගිය හෙයින් වලංගු භාවයෙන් තොර බවය. අභියාචනා පිළිගෙන ප්‍රිවි කවුන්සලය විසින් දඬුවම් පැමිණවීම නිෂ්ප්‍රභා කරන ලදී.

බණ්ඩාරනායක මැතිනියගේ පළමුවන පාර්ලිමේන්තු සමයේ දී, එතුමිය අත්දුටු වැදගත්ම නඩු විභාගය මෙන්ම දුෂ්කර අවස්ථාවක් ලෙස මෙය හැඳින්විය හැක. මෙම මුළු කාලයේ දීම තම නීතිඥයින් උදාවුණ තත්ත්වය ගැන කටයුතු කළ අතර, එතුමිය තැති නොගෙන ශාන්ත භාවයක් පෙන්වූවාය. මෙම මුළු සිද්ධිය ගැන මෙනෙහි කරන විට, මේ නඩු විභාගය, විශේෂ වූ නීතිවල සහාය නොපතා, සාමාන්‍ය නීතිය යටතේ කෙරුණේ නම්, අවසාන ප්‍රතිඵලය වෙනස් වීමට බොහෝ සෙයින් ඉඩ තුබුණ බව පෙනීයයි. මේ අතර 1963 දී ශ්‍රේෂ්ඨාධිකරණය තමා වෙත යොමු කළ විවේචනාත්මක චෝදනා අභිමුඛයෙහි අධිකරණ ඇමති ඉල්ලා අස්විය. ඔහුගේ අනුප්‍රාප්තික ඒ.බී. පෙරේරා මහතා පත්වූ විගසම මෙන් අභාවප්‍රාප්ත වූ හෙයින් ජී.සී.ටී.ඒ. ද සිල්වා මහතා අධිකරණ ඇමති ලෙස පත්විය.

දෛවයේ උපහාසයක් මෙන්, තදබල අවම දඬුවම් නියම කළ අතීතානුයෝගී නීති යටතේ බණ්ඩාරනායක මැතිනියට එරෙහිව නඩු පවරා වරදකරු කොට දඬුවම් පැමිණ වූ අවස්ථාවේ දී එතුමියට කුමන හෝ පිළියමක් නොතිබිණ. මේ අවස්ථාවේ දී රජය අධිකරණයට මැදිහත් වීමේ පැහැදිලි දූෂ්ටකමක් පෙනුණි. අභියාචනාධිකරණය රජයේ ක්‍රියාමාර්ගයට එරෙහිව තීරණය කළ විට, එම උසාවියේ බලය ඉවත් කිරීම සඳහා අප්‍රමාදව ව්‍යවස්ථා සම්පාදනය කිරීමට තරම් රජය සහාසික විය.

බණ්ඩාරනායක මැතිනියගේ පළමු වන සේවා කාලයේ දී, එතුමියට මුහුණ දීමට සිදු වූ ප්‍රධාන ප්‍රශ්නයක් වූයේ ලංකා පුවත්පත් මණ්ඩල පනත සම්මත කිරීමේ පළමු ප්‍රයත්නයය. මෙහිදී එක් අතකින් බලන විට නීත්‍යානුකූල වුව ද, පාර්ලිමේන්තු සම්ප්‍රදායට එරෙහි කූට උපක්‍රමයකින් ඇයගේ අපේක්ෂාව ව්‍යාර්ත විය.

අදාළ පනත සෙනෙට් සභාවේ දී සම්මත වී තුබුණි. මෙවැනි තත්ත්වයක් යටතේ එය නියෝජිත මන්ත්‍රණ සභාවට, පාර්ලිමේන්තුවට, පළමුව ඉදිරිපත් කෙරෙනුයේ සන්දේශයක් මගිනි. ඉන්පසු දෙවැනි කියවීම සඳහා නියම කළ යුත්තේ එම දැනුම් දීමට දින පහකට නොඅඩු දිනයක්ය. (ස්ථාවර නියෝග 77). මෙම පනත සභාවට ඉදිරිපත් කළ අවස්ථාවේ දෙවැනි කියවීමේ දිනය කුමක් දැයි කථානායකවරයා සභානායක තනතුර ඉසිලූ මයිකල් ද ඉසැඩ් සිරිවර්ධන ඇමති තුමාගෙන් විමසූ විට, ඔහු සිරිත් පරිදි "හෙට" යනුවෙන් පිළිතුරු දුණි. මේ අතර පාර්ලිමේන්තු මන්ත්‍රී ලක්ෂමන් රාජපක්ෂ සභාවේ ලේකම් ලෙස ක්‍රියාකළ රැල්ෆ් දැරණියගල මහතාට, පනතේ දෙවැනි කියවීම 1965 පෙබරවාරි 2 වැනි දින විය යුතු යැයි දැනුම් දීමක්, පුත්තලම මන්ත්‍රීගේ ද අත්සන ඇතිව භාර දෙනු ලැබීය. මේ සමගම ප්‍රවෘත්ති පත්‍ර පනත දෙවැනි වර කියවීම, විවාද කිරීම, කුමන දිනක ගත යුතු ද යන්න ගැන තර්ක කිරීමක් ඇති විය. දෙපක්ෂයේම තර්කයනට ඇහුම්කම් දීමෙන් පසුව, කථානායක හියු ප්‍රනාන්දු රැස්වීම අත්හිටුවන ලදී.

නැවත රැස්වීම ආරම්භ කළ පසු කථානායක තම නියෝගය මෙසේ ප්‍රකාශ කළේය. "77 වැනි ස්ථාවර නියෝගය යථාර්ථ වශයෙන් අර්ථ නිරූපණය කළ විට ගරු කම්කරු ඇමතිගේ (එච්. ද ඉසෙඩ් සිරිවර්ධන) දැනුම් දීම එම ස්ථාවර නියෝගයෙන් අපේක්ෂිත පූර්ණ අනුග්‍රාහකත්වය පෙන්නුම් නොකරයි. සභාවේ ලේකම්ට පුත්තලම සහ හම්බන්තොට ගරු මන්ත්‍රීන් කර ඇති දැනුම් දීම 77 වැනි ස්ථාවර නියෝගයට අනුකූල වේ.'' ඒ අනුව පනත මාස හතරකට පසුව විවදය සඳහා ගන්නා බව ඔහුගේ නියෝගය විය.

ප්‍රවෘත්ති පත්‍ර පනත ප්‍රමාද කිරීමට විරුද්ධ පක්ෂය ගත් ප්‍රයත්නය මෙසේ සාර්ථක වූ පසු රජය විසින් පාර්ලිමේන්තුවේ පස්වැනි සැසිය අවසන් කර හයවැනි සැසිය 1964 නොවැම්බර් 26 වැනි දින ආරම්භ කරන ලදී. කෙසේ වුව ද, දෙසැම්බර් 04 වන දින රාජාසන කථාව පිළිබඳ ඡන්ද විමසීමේ දී ගරු ඩබ්. දහනායක මහතා ඉදිරිපත් කළ සංශෝධනයක් මත රජය එක් ඡන්දයකින් පරාජයට පත්විය. ඒ අනුව රජය පාර්ලිමේන්තුව විසුරුවා හැර 1965 මාර්තු විසි දෙවැනි දිනට නව මහ මැතිවරණයක් පැවැත් වීමට තීරණය කළාය.

මේ අතරතුර දෙසැම්බර් 07 වැනි දින රාජාසන කථාව පිළිබඳ ඡන්දය පැවැත් වුණ අවස්ථාවේ රටින් බැහැරව සිටි මන්ත්‍රී කණ්ඩායමක් සහ කුමන හේතුවක් නිසා හෝ ඡන්දයට සහභාගී වීමට නොහැකි වූ තවත් මන්ත්‍රී පිරිසක් එක්ව, ඉල්ලා අස්නොවී විශ්වාසය ලබාගැනීම සඳහා පාර්ලිමේන්තුවේ ඡන්දයක් ඉල්ලා සිටින ලෙස බණ්ඩාරනායක මැතිනිය පෙළඹවීමට උත්සාහයක් දැරීය. නමුත්, බලයේ රැඳීමට එවැනි ක්‍රියාමාර්ගයක් අනුගමන කිරීම තරයේ ප්‍රතික්ෂේප කළ එතුමිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේක්ෂකයෙකු ලෙස කොමියුනිස්ට් සහ ලංකා සමසමාජ පක්ෂවල සහාය ඇතිව ඡන්ද විමසීමට ඉදිරිපත් වූවාය. වයස 18 ඉක්ම වූවනට ඡන්ද බලය ලැබුණ ප්‍රථම අවස්ථාව මෙම ඡන්දය විය.

බණ්ඩාරනායක මැතිනියගේ රජයේ පරාජයට ප්‍රධාන හේතුව නම්, පුවත්පත් පනත නිසා ඇති වූ භීතියයි. පුවත්පත් ජනසතු කිරීමේ ප්‍රධාන ඉලක්කය වූ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම මෙම බිය ඉස්මතු කොට පැතිර වීමට සෑම උත්සාහයක්ම දැරීය. රජය පෙරළීම තහවුරු කිරීම සඳහා එතුමියගේ පාර්ශ්වයෙන් 14 දෙනෙකු විරුද්ධ පක්ෂයට ගියහ. කෙසේ වුව ද, මෙම සිදුවීම් හෝ මාධ්‍යය ඒවා පිළිබඳව කළ අර්ථ දැක්වීම් එතුමියගේ ජනප්‍රිය භාවය පලුදු කිරීමට අපොහොසත් විය. තම අත්තනගල්ල ආසනය වැඩි ඡන්ද විශාල ගණනකින් - 16,525කින් - දිනා ගැනීමට ඇය සමත් වූවාය. එක්සත් ජාතික පක්ෂයට වැඩිම ආසන ගණනක් දිනා ගැනීමට හැකි වුව ද, බහුතරයක් නොලැබීම හේතුවෙන් වෙන කණ්ඩායමක් හවුල් කරගෙන සභාග රජයකින් සෑහීමට පත්වීමට සිදුවිය.

1965 ඡන්දයෙන් පසුව, විරුද්ධ පක්ෂයේ නායිකාව ලෙස කටයුතු කිරීම ආරම්භ කර වැඩි කලක් යන්නට මත්තෙන් කොලොන්න මන්ත්‍රී නන්ද මැතිව්ගේ නමින් න්‍යාය පත්‍රයේ ප්‍රශ්නයක් ඇතුළත් කර තුබුණි. ඒ බණ්ඩාරනායක මැතිනිය අගමැති තනතුරේ සිටි කාලයේ දී, ලංකා රක්ෂණ සමාගම එතුමියට මෝටර් රථයක් තෑගී කිරීම ගැනය. මන්ත්‍රී සගයෙක් හා සම්බන්ධ ප්‍රශ්නයක් පාර්ලිමේන්තුවේ දී ඇසිය නොහැකි හෙයින් ඊට ඉඩ නොලැබිණි. නමුත් එවකට පැවති රජය එය පිටුපස එලවා ගිය හෙයින් මෙම ත්‍යාගය ගැන කරුණු විමසා වාර්තා කිරීමට තේරීම් කාරක සභාවක් පත් කිරීමට සභාව එකඟ විය.

ගරු ජේ.ආර්. ජයවර්ධන මහතාගේ සභාපතිත්වයෙන් යුත් කාරක සභාවට කථානායකතුමා විසින් වෙනත් මන්ත්‍රීවරු හත් දෙනෙක් ද පත් කරනු ලැබීය. පාර්ලිමේන්තුවේ මහ ලේකම් ලෙස, අදාළ රක්ෂණ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා ඇතුළු ලබාගත හැකි සියලුම සාක්ෂි කාරක සභාවට ලැබෙන බවට මම වගබලා ගත්තෙමි. සීමාසහිත ලංකා රක්ෂණ සමාගමේ ලේකම්, 1960 අප්‍රේල් මස සීමාසහිත රෝලන්ඩ්ස් සමාගමෙන් කළ ඉල්ලීමක් අනුව රු. 19,935/-ක් වටිනා මෝටර් රථයක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සභාපති (සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය) වෙත භාරදී ඇති බව කමිටුවට දැනගත හැකි විය. එය එතුමියගේ නමින් පසුව ලියාපදිංචි කර තුබුණි. කෙසේ වුව ද, තවත් පෙනීගිය

කරුණක් නම්, මෝටර් රිය බණ්ඩාරනායක මැතිනියට දීමට තීරණයක් කර තුබුණේ රක්ෂණ සමාගමේ සභාපති මෙන්ම කළමනාකාර අධ්‍යක්ෂක වූ ද, ලංකා රක්ෂණ සමාගමේ අතුරු සමාගමක් මෙන්ම ප්‍රචාරක කටයුතු භාරව ක්‍රියා කළ මිඩල්වේස් ප්‍රකාශන සමාගමේ අධ්‍යක්ෂ තනතුරක් ද ඉසිලූ ජස්ටින් කොතලාවල මහතා බවයි.

මෙම විභාගයේ දී පෙනී ගියේ රථය ප්‍රදානය කෙරුණේ බණ්ඩාරනායක මැතිනියගේ පාවිච්චියට නොව, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නිල ප්‍රවෘත්ති පත්‍රය වන 'සිංහලේ' පත්‍රයේ කතෘ සහ කළමනාකරු තත්ත්වය ඉසිලූ ධර්මසිරි කුරුප්පු මහතාගේ ප්‍රයෝජනයට බවයි. මෝටර් රථය කුරුප්පු මහතාට දුන් පසු ප්‍රචාරක දැන්වීම් හේතුවෙන් 'සිංහලේ' පත්‍රයට ලැබුණ ආදායම වැඩි විය. ආදායම් ලැබුනේ මිඩල්වේස් සමාගම හරහාය. මෙම ගනුදෙනුව ගැන බණ්ඩාරනායක මැතිනියට දැනගන්නට ලැබුණේ ධර්මසිරි මහතා එතුමිය වෙත ගොස් පත්‍ර සංස්කාරකට වාහනයක් ලබා දෙන ලෙස කොතලාවල මහතා පොළඹවා ගැනීමට තමා සමත් වූ බවට පුරසාරම් දෙඩූ විට ය. "ඒ වනතෙක් මා මේ ගැන කිසිවක් දැන සිටියේ නැත" යනුවෙන් ඇය ප්‍රකාශ කළාය.

මැතිනියගේ නමින් රථය ලියාපදිංචි කිරීම යෝජනා කර තුබුණේ කොතලාවල මහතාමය. බණ්ඩාරනායක මැතිනිය දුරකථනයෙන් ඇමතූ කොතලාවල මහතා කියා ඇත්තේ සංස්කාරක ඔබ වෙත කොතෙක් කල් රැඳී සිටී ද යන්න මම නොදනිමි. ඔබ ඔහු සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත. නොඑසේ නම් ඔහු වෙනතැනකට යෑමට ඉඩ ඇත. එවිට ඔහුට වාහනය රැගෙන යා හැකි නමුත්, වාහනය ඔබේ නමින් ලියාපදිංචි කළහොත් එය "සිංහලේ" වෙත රැදෙනු ඇත යනුවෙනි.

බණ්ඩාරනායක මැතිනිය මෙම යෝජනාවට එක්වරම එකඟ නොවී, ඒ ගැන අධිකරණ ඇමති සෑම් පී.සී. ප්‍රනාන්දු මහතා විමසා තිබේ. ඔහුගේ උපදෙස් මත ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති ලෙස ඇයගේ නමින් රථය ලියාපදිංචි කරන ලදී. කමිටුව ප්‍රකාශ කර සිටියේ මෝටර් රථය, ලංකා රක්ෂණ සමගමට හෝ වෙන රක්ෂණ කරුණක් පිළිබඳව වාසියක් ලබාගැනීම සඳහා රාජ්‍ය නායිකාව කෙරෙහි බලපෑමක් කිරීම සඳහා දුන් බවට කිසිම සාක්ෂියක් තමනට සොයා ගත නොහැකි වූ බවය. පත්‍රයේ වූ ප්‍රශ්නයට පමණක් පිළිතුර සීමා වූයේ නම් මෙම කරුණ පිළිබඳ මෙවැනි පැහැදිලි කිරීමකට එතුමියට අවකාශයක් ලැබෙන්නේ නැත.

1968 දී කොමියුනිස්ට් සහ සමසමාජ පක්ෂ සමග ඇති කරගත් විධිමත් ගිවිසුමක් යටතේ බණ්ඩාරනායක මැතිනිය, 1970 මහා මැතිවරණය සඳහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට නායකත්වය දෙමින් ඉදිරිපත් වූවාය. 1970 මැයි 27 වැනිදා නිකුත් කළ මැතිවරණ ප්‍රතිඵලයෙන් පෙනී ගියේ ගිවිසුම්ගත පක්ෂ තුනට ආසන 168න් 115ක් ලැබුණ බවය. එක්සත් ජාතික පක්ෂයට ලබාගත හැකි වූයේ ආසන 17ක් පමණි. කෙසේ වුව ද, විස්තරාත්මකව මැතිවරණ ප්‍රතිඵල දෙස බලන විට පෙනී ගිය කරුණක් නම්, මෙම හවුල්කරුවනට මුළු ඡන්ද 2,415,322ක් පමණක් ලැබුණ හෙයින් ඔවුන් ලබාගත් සෑම ඡන්ද 21,000කටම ආසනයක් ලැබුණ අතර, ඡන්ද 1,876,756ක් ලබාගත් එක්සත් ජාතික පක්ෂයට එක් ආසනයක් සඳහා ඡන්ද 110,000ක් ලබා ගැනීමට සිදු වූ බවය. 1977 එක්සත් ජාතික පක්ෂ රජය තම නව ව්‍යවස්ථාවෙන් සමානුපාතික ඡන්ද ක්‍රමය ඉදිරිපත් කිරීමට හේතු වූ එක් වැදගත් කරුණක් වූයේ මෙම තත්ත්වයයි. එහෙත් මෙම ප්‍රතිකර්මය වෙනත් ප්‍රශ්නවලට හේතු විය.

නැවත බලය ලබාගත් සිරිමාවෝ බණ්ඩාරනායක රජය 1964 බාධකයෙන් ඉදිරියට ගොස් දෙවැනි ප්‍රවෘත්ති පත්‍ර පනත මගින් සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම - ලේක් හවුස් - රජයට පවරා ගැනීමට සමත් විය. මේ අතරතුර 1970 දැවැන්ත මහජන වරම විසින් 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බිහි කිරීමට රජය ධෛර්යමත් කරන ලදී.

ශ්‍රී ලංකා ජනරජයේ මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නව අංගයක් වූයේ ව්‍යවස්ථාමය අධිකරණයයි. යෝජනා කෙරෙන පනත්, ඒවායේ නීත්‍යානුකූලත්වය පිළිබඳ තීරණයක් ලබා ගැනීමට මෙම අධිකරණයට ඉදිරිපත් කිරීම අවශ්‍ය විය. ව්‍යවස්ථාමය අධිකරණයෙන් අනුමැතිය ලැබුණ පසු වෙනත් ක්‍රියාමාර්ග මගින් පනතක වලංගුභාවය ප්‍රශ්න කළ නොහැක. තම තීරණය දින 14ක් තුළ කථානායකට ඉදිරිපත් කිරීමට මෙම අධිකරණය බැඳී තිබුණි.

ප්‍රවෘත්ති පත්‍ර පනත සම්බන්ධයෙන් තම තීරණය නියමිත දින 14 තුළ ප්‍රකාශ කිරීමට ව්‍යවස්ථාමය අධිකරණය අපොහොසත් විය. කථානායක මුහුණ දුන් පළමුවැනි ප්‍රශ්නය නම්, මෙම අධිකරණය වෙත යොමු කර තුබූ ප්‍රශ්න අරභයා තීරණයක් නොමැතිව පනතේ දෙවැනි කියවීමට ඉඩදිය හැකි ද යන්නයි. මෙම අධිකරණයේ මතය නොමැතිව පනත පිළිබඳව තවදුරටත් කටයුතු කරගෙන යෑමට රජයට මහත් උනන්දුවක් තුබුණි. නමුත් කථානායක තුමාගේ තීරණය වූයේ පනත පිළිබඳ තවදුරටත් කටයුතු කිරීමට ප්‍රථමයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 59 වැනි වගන්තිය යටතේ තීරණයක් ලබාගත යුතු බවය. කථානායකගේ මෙම ප්‍රකාශයත් සමග ආචාර්ය එන්.එම්. පෙරේරා නැගිට මෙසේ කීය. ඔබගේ නියමයෙන් මට වැටහෙන්නේ මේ අවස්ථාවේ දී පනත දෙවැනි වරට කියවීමේ නිරත විය නොහැකි බවයි. මා කියා සිටින්නේ ඔබගේ තීරණය පිළිනොගත යුතු බවයි; මෙම සභාව වෙත ඔබ කෙරෙහි විශ්වාසයක් නොමැති බවට යෝජනා කිරීමට මම අදහස් කරමි" මේ අවස්ථාවේ දී ජේ.ආර්. ජයවර්ධන මහතා මෙසේ ප්‍රශ්න කළේය. "එය රජයේ තීරණයක් ද, මුදල් ඇමතිගේ තීරණයක් ද"? බණ්ඩාරනායක මැතිනිය ප්‍රකාශ කළේ එය රජයේ තීරණයක් නොවන බවයි. මෙම කරුණ නිමා විණි.

1995 නොවැම්බර් මස පැවති අයවැය විවාදයේ දී තම කථාවෙන් බණ්ඩාරනායක මැතිනිය මෙසේ පැවසීය. ''කාලයක් සිට ඉතාමත් වැදගත් දෙයක් ප්‍රකාශ කිරීමට මට උවමනා වී තුබුණි. මේ මා සහභාගී වන හයවන පාර්ලිමේන්තුවයි. මෙය කීමට මට අයිතියක් මෙන්ම වගකීමක් තිබෙනවා. මෑත කාලයක සිට අපේ මන්ත්‍රීවරුන්ගේ හැසිරීම ගැන මම සැබවින්ම කම්පා වී සිටිමි. මේ අපගේ රටේ පාර්ලිමේන්තුවයි. අපි පාර්ලිමේන්තුවට එවන්නේ ජනතාවයි. ඔවුන්ට වුවමනා ඔවුන්ගේ ප්‍රශ්න අප මගින් විසඳවා ගැනීමයි. මෙතැන ඇතැම් විට අසභ්‍ය වචන කතා කිරීම හා කුලල් කා ගැනීම් සිදුවෙනවා. ජනතාව, විශේෂයෙන් මේ ගැලරියේ සිටින ළමයින් අප දෙස බලා සිටින බව සමහර විට අපිට අමතක වෙනවා. මෙම සභාවේ දී අප විනය ගරුක නොවී පාසල් ළමයින්ගෙන්, සරසවි සිසුන්ගෙන් යහපත් හැසිරීමක් කෙසේ අපේක්ෂා කරමු ද? ඇතැම් විට මන්ත්‍රීවරුන්ට කථා කිරීමටවත් ඉඩ ලැබෙන්නේ නැත. ඝෝෂා කර ඔවුන් නිහඬ කරනවා. නිතර මා මෙහි නොපැමිණීමට එක් හේතුවක් මෙයයි. අප මෙම සභාවේ ගෞරවය ආරක්ෂා කළ යුතුය. අපට ලැබෙන යම් වාසි තකා මෙහි පැමිණීම සුදුසු නැත. අප සියළු දෙනාම ආදර්ශමත් අන්දමට මෙහි හැසිරීමට ඉටා ගනිමු.”

බණ්ඩාරනායක මැතිනිය දේශපාලනයට පිවිස පනස් වසරක් ගෙවෙන මේ අවස්ථාවේ එතුමියගේ වචන අප සිත්හී තබා ගත යුතුය. එතුමිය මතු පරම්පරාවන්ට අනගි ආදර්ශයකි.